**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය - 2018**
**-------------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.**

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.**

**මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.**

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.**

**1.4** විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5** මූල්‍ය ප්‍රකාශන
---------------

**1.5.1** මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය
-------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
-----------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිත අංක 02 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී, රු.208,479 ක් වූ උපචිත පාරිතෝෂික ගෙවීම් පාරිතෝෂික වියදම් යටතේ දැක්වීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරීත්වය තුළින් ජනිතවූ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණු අතරම ආයෝජන මුදල් ප්‍රවාහයද රු.694,657 කින් අඩුවෙන් මූදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | මෙවැනි දෝෂයන් ඉදිරියේ දී ඇති නොවන ලෙසට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කරන ලෙසට අවශ්‍ය උපදෙස් ලබා දී තිබෙන බව. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් තොග අයිතම 5 ක වටිනාකම රු.4,581,263 ක් වුවද භෞතික තොග සත්‍යාපන වාර්තා අනුව එම වටිනාකම රු.9,953,188 ක් වූයෙන් එම අගයන් අතර රු.5,371,925 ක වෙනසක් නිරීක්ෂණය විය. | ගොඩනැගිල්ලෙහි නවීකරණය කටයුතු හේතුවෙන් තොග ආගණනය කිරීමේ දෝෂ, ද්වි ගණන දෝෂ සහ එකතු දෝෂ මෙවැනි තත්ත්වයක් උද්ගත වීමට හේතු වී ඇතැයි අපේක්ෂිත බව හා ඉදිරි වර්ෂවල දී නිවැරදි තොග සත්‍යාපනයක් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව. | මූල්‍ය ප්‍රකාශන අනුව දක්වන තොග වටිනාකම භෞතික සත්‍යාපනය මගින් තහවුරු විය යුතු බව හා වෙනස්කම් පවතීනම් සැසඳීම් කර තහවුරු කර ගත යුතු බව. |
| (ආ) විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම මත කතෘගෙන් ලබාගන්නා පොත් සඳහා 2018 මැයි 15 වන දින සිට දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ කතෘවරුන් වෙත ගෙවීම් සිදුකර නොතිබූ මුදල හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි | පරිගණක මෘදුකාංගයෙහි වූ දෝෂයන් හේතුවෙන් කතෘන් වෙත ගෙවිය යුතු ශේෂය ලබා ගත නොහැකි වීම සහ මූල්‍ය වාර්තා ප්‍රමාදයකින් තොර ව ඉදිරිපත් කළ යුතු වීම මත මෙම තත්ත්වය උද්ගතවී ඇති බව හා ඉදිරියේදී අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට නියමිත බව. | බැරකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය |

**1.6 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2012 මැයි 22 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා තීරණය | මණ්ඩලයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්ට 2010 වර්ෂයේදී නීත්‍යානුකූල නොවන ආකාරයට වැටුප් වශයෙන් වැඩිපුර ගෙවා තිබුණු රු.247,500 ක් ආපසු අයකර ගෙන රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවට වාර්තාකරන ලෙස ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට නියෝගකර තිබුණද 2020 පෙබරවාරි 13 දින වන විටද එම නියෝගය අනුව කටයුතුකර නොතිබුණි. | කාරක සභා නියෝගය ප්‍රකාරව විවිධ උත්සාහයන් දරන ලදී තවද නීතිපති දෙපාර්තමේන්-තුවෙන් ද වැඩිදුර උපදෙස් ලබා ගැනීම සිදු කර ඇති අතර, එම දෙපාර්තමේන්තුව විසින් වරින්වර දෙනු ලැබූ උපදෙස් පරිදි මණ්ඩලය විසින් අවශ්‍ය පියවර ගනු ලැබීය. නමුත් ඒ සියල්ල ද අසාර්ථක වූ අතර, අවසානයේ කාලාවරෝධ නීතිය යටතේ මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි බව නීතිපති දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇති බව | කාලවරෝධ නීතියට යටත් වීමට පෙර අදාල මුදල් අයකර ගැනීමට පොදු ව්‍යාපාර කාරකසභා නියෝගය අනුව කටයුතු කළයුතුව තිබූ බව |

| | | | |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයෙහි **756** වන මුදල් රෙගුලාසිය | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු. **108,537,706** ක් වටිනා ජාත්‍යන්තර පොත් තොගය සහ ජාතික පුස්තකාලයේ සංරක්ෂිත පොත් තොගය සමාලෝචිත වර්ෂයේදී සමීක්ෂණය කර නොතිබුණි. | ගොඩනැගිල්ලෙහි නවීකරණ කටයුතු අවසන් වීමෙන් පසු සම්පූර්ණ පොත් එකතුන් ප්‍රතිසංවිධානය කිරීමට නියම කර ඇත . එම .කටයුතු අවසන් වූ පසු ජාතික පුස්තකාලයේ සම්පූර්ණ පොත් එකතුව සමීක්ෂණය සිදු කරනු ලබන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව |
| (ඇ) **2003** ජුනි **02** දිනැති අංක පීඩී/**12** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ- **6.5.1** වගන්තිය | මූල්‍ය වර්ෂය අවසන් වී දින **60** ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, **2018** වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කරන ලද්දේ **2019** දෙසැම්බර් **31** දින වන අතර **2019** වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන **2020** දෙසැම්බර් **31** දින දක්වාම විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මණ්ඩලයේ දිගින් දිගට ම පැවති ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයත් පෙර ගිණුම් වර්ෂයට අදාළ විගණන වාර්තාව ලද පසු නිවැරදි කිරීම් සිදු කිරීමට යම් අතිරේක කාල පමාවක් ගත වීමත් මූල්‍ය ප්‍රකාශන ප්‍රමාද වී තිබෙන බව හා නව ගිණුම්කරණ මෘදුකාංග පද්ධතිය සමග වෙනස් කිරීමට සිදු වීම ද බලපාන ලද කරුණක් බව | චක්‍රලේඛ විධිවිධාන වලට අනුගත වී මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු බව |

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. **15,513,944** ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. **7,801,955** ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. **7,711,989** ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පරිපාලන වියදම් රු. **13,811,785** කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **2017** වර්ෂයේ වාහන විකිණීමෙන් ලද රු. **2,710,862** ක් වූ මුදල ඒකාබද්ධ අරමුදලට බැර නොකර මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මණ්ඩලය විසින් ලබාගැනීමට යෝජිතව තිබූ වාහනවල මාසික කුලිය ගෙවීම සඳහා රඳවා තබාගෙන තිබුණි. එයින් රු.**1,534,880** ක් සමාලෝචිත වර්ෂය තුළදී මෙහෙයුම් කල්බදු පදනමට ලබාගත් වාහන දෙකෙහි මාසික වාරික මුදල් ගෙවීම සඳහා භාවිතා කර තිබුණි. | වාහන විකිණීමෙන් ලද ප්‍රාග්ධන ලාභය මෙහෙයුම් කල්බදු වාරික ගෙවීම සඳහා රු. **1,534,880** ක් ද විවිධ ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා රු. **1,175,982** ක් ද ලෙස වියදම් කරන ලද බව හා මහා භාණ්ඩාගාරය මගින් ප්‍රාග්ධන ප්‍රතිපාදන ලබා දීමේ දී එම වටිනාකම අඩුවෙන් ප්‍රතිපූර්ණය කර ඇති බව | වාහන විකිණීමෙන් ලද මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු බව හා ප්‍රාග්ධන ලාභයෙන් පුනරාවර්තන වියදම් නොදැරිය යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මණ්ඩලය විසින් 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා මුද්‍රණය කරනු ලැබූ රු.2,357,948 ක් වටිනා මණ්ඩලීය ප්‍රකාශන 9,145 ක් විගණිත දිනය වූ 2020 පෙබරවාරි 12 දින වන විටත් ගබඩාවේ සහ ග්‍රන්ථ විඥාපන පාලන අංශය තුළ ඉතිරිවී තිබුණි. | මණ්ඩලයීය ගබඩාව තුළ ඉතිරි ව ඇති ග්‍රන්ථ විඥාපන පාලන අංශයට අයත් ප්‍රකාශන මෙම වසරේ දී මණ්ඩලය මගින් බාහිර ව හා අභ්‍යන්තර ව සංවිධානය කරනු ලබන විවිධ වැඩමුළු හා සම්මන්ත්‍රණවල දී බෙදා හැරීමට කටයුතු කරනු ලැබේ. | මණ්ඩලීය ප්‍රකාශන අලෙවි කිරීම හා බෙදාහැරීම පිළිබඳ ස්ථිර සැලැස්මක් සකස් කළ යුතු බව. |
| (ඇ) | ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ද ඇතුළත්ව ප්‍රධාන මහජන පුස්තකාල ආශ්‍රිතව ඩිජිටල් පුස්තකාල 26 ක් වසර දෙකක් තුළ ආරම්භ කිරීමට සැලසුම් කර පළමු අදියර යටතේ පුස්තකාල 8 ක වැඩ කටයුතු නිමකර නිල වශයෙන් විවෘත කිරීමට නියමිතව පැවතුණ ද එම කාර්යයන් ඉටුකර නොතිබුණි. තවද, 2018 වර්ෂය සඳහා සැලසුම් කර තිබූ ජාතික ඒකාබද්ධ සූචිය දත්ත පදනම යාවත්කාලීන කිරීම සහ "පශ්චාත් උපාධි නිබන්ධ අනුක්‍රමණිකාව" 2011 – 2016 අදාල ග්‍රන්ථය සම්පාදනය කිරීම සිදු කර නොතිබුණි. | වගකීම් පිළිබඳ යම් යම් එකඟතාවයන්ට එළඹීමට පාර්ශ්ව කරුවන් අතර යම් කාලයක් ගත වූ හෙයින් ගිවිසුම් අත්සන් කිරීමට ප්‍රමාද වුව ද මේ වන විට ගිවිසුම් අත්සන් කර පළමු අදියරට අදාළ පුස්තකාලවල වැඩ කටයුතු අවසන් ව නිල වශයෙන් විවෘත කිරීමට පවතින බව සහ ඉදිරියේ දී සැලසුම් කළ පරිදි ව්‍යාපෘති කාලය තුළ ම අදාළ වැඩ කටයුතු අවසන් කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලද බව. | සැලසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු බව |
| (ඈ) | ජාතික පුස්තකාල එකතුව සඳහා අත්පත්කරගත් පොත්වලින් ආවරණය නොවන විෂය ක්ෂේත්‍ර හඳුනාගෙන එම පොත් අත්පත් කරගැනීමට, පුස්කොළ පොත් එකතුව වර්ධනය කිරීම සඳහා පුස්කොළ පොත් අත්පත්කරගැනීමට, දිවයිනේ පුස්තකාලවල වත්මන් තත්ත්වය පිළිබඳ සමීක්ෂණ පැවැත්වීමට, පුස්තකාල වල KOHA මෘදුකාංගය භාවිතයෙන් ස්වයංක්‍රීයකරණය කිරීමට සමාලෝචිත වර්ෂයේ සැලසුම් කර තිබූ නමුත් එය ඉටුකර නොතිබුණි. | ශ්‍රී ලංකා ජාතික පුස්තකාල එකතුව පරිපූර්ණ එකතුවක් බවට පත් කර ගැනීම සඳහා විවිධ ක්‍රමවේද ඔස්සේ ප්‍රකාශන අත්පත් කර ගැනීමට පැරණි එකතු අත්පත් කර ගැනීම මගින් හැකි වී තිබේ.<br>පොත් පරිත්‍යාග ඉල්ලීම් ලැබී තිබෙන අතර, ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු නිමවන තුරු අත්පත් කර ගැනීම නවතා තිබේ. පුස්තකාල හා විඥාපන විද්‍යා විෂය ක්ෂේත්‍රයේ ඇති වූ නව ප්‍රවණතා ආවරණය කිරීමට 2018 වර්ෂයේ ප්‍රකාශන මිල දී ගැනීමට පියවර ගෙන තිබේ. | සැලසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු බව |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 ප්‍රසම්පාදන සැළැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කරන ලද වර්ෂය තුළදීම සිදු නොකිරීම නිසා 2018 ජනවාරි 01 දිනට වැය නොකර ඉතිරිව තිබූ ශේෂය ද ඇතුළුව රු. 37,592,602 ක ප්‍රාග්ධන ප්‍රදානවලින් රු.2,881,696 ක් 2018 දෙසැම්බර් 31 දිනට උපයෝජනය නොකර රඳවා තබාගෙන තිබුණි. | ප්‍රසම්පාදන කාර්යයක් වර්ෂය තුළ දී අවසන් කළ ද රඳවාගැනීම් සහ නිරවුල් නොකරන ලද බදු මුදල් මණ්ඩලය තුළ රඳවා ගනු ලබයි. එසේ ම ප්‍රායෝගික ව මතු වන සීමා සහ ගැටළුකාරී තත්ත්වයන් මත වර්ෂය තුළ දී ම අවසන් නොවන කාර්යයන් සඳහා ගෙවීම් සඳහා ද අරමුදල් රඳවා ගත යුතු බැවින් ඉහත පරිදි ශේෂයක් පෙන්නුම් කරනු ලබන බව. | ප්‍රසම්පාදන සැලැස්මට අනුව කටයුතු කළ යුතු බව |
| (ආ)ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලීය ගොඩනැගිලි සංකීර්ණය නවීකරණ කටයුතු නිමකර තිබූ නමුත් ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතුවල අඩුපාඩු පැවතුණි. 2020 පෙබරවාරි 24 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී අවසන් නොකළ කාර්යයන් 20 ක් පැවති බව නිරීක්ෂණය වූ අතර නවීකරණ කටයුතුවල වූ අඩුපාඩු හේතුවෙන් මණ්ඩලයේ අරමුණු හා කාර්යයන් ඉටු කිරීමේදී එය බාධාවක් වී පැවතුණි. | මණ්ඩලයීය ගොඩනැගිල්ලෙහි ඉදි කිරීම් කටයුතු අධීක්ෂණය කරනු ලබන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය මගින් වේ. ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු අවසන් කොට නොමැති බැවින් රජයේ විගණන අංශය විසින් ඉදිරිපත් කොට ඇති සිට දක්වා වූ කරුණු සමඟ එකඟ වේ.<br>අධ්‍යාපන අමාත්‍යාංශයේ විශේෂ ව්‍යාපෘති ඒකකය විසින් වාචික ව දන්වා ඇති පරිදි ගොඩනැගිල්ල ඉදි කිරීමේ වැඩ කටයුතු අවසන් කිරීම සඳහා මිලියන 110.5ක පමණ මුදලක් අවශ්‍ය බවත්, මුදල් ලැබීමේ ගැටලුවක් මතු ව ඇති බැවින් 2020 වසරේ දී කාර්යයන් අඩපණ වී ඇති අතර, අදාළ මුදල් වෙන් වූ විගස කටයුතු අවසන් කිරීමට අවශ්‍ය පියවරයන් ගනු ලබන බව | රාජ්‍ය මුදල් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතා කළ යුතු බව. |

### 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් කාර්යයන් වෙනුවෙන් පැවැත්වීමට යෝජිත වැඩසටහන් පිළිබඳව පූර්ව සැලසුම් සකස් නොකර වර්ෂය තුළදී ලැබෙන ඉල්ලීම් සලකා බලා වැඩසටහන් තෝරාගෙන ක්‍රියාත්මක කර තිබුණි. | ඉදිරි වසරේ දී සකස් කරනු ලබන සියලු ව්‍යාපෘති සඳහා පූර්ව සැලසුම් සකස් කරන ලෙසත් ඒ අනුව ක්‍රියාත්මක කරන ලෙසත් අදාළ අංශවල වගකිව යුතු නිලධාරීන් දැනුවත් කරන බව | පූර්ව සැලසුම් සකස් කර සැළසුම් වලට අනුව කටයුතු කළ යුතු බව |

| | | |
|---|---|---|
| (ආ)ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ජාතික පුස්තකාල සම්පත් සුවිගත කිරීම හා ජාතික පුස්තකාල සුචිය පරිගණකගත කිරීම, පශ්චාද් උපාධි නිබන්ධන අනුක්‍රමණිකාව 2011 – 2016 ග්‍රන්ථය සම්පාදනය කිරීම, ජාතික ඒකාබද්ධ සුචිය දත්ත පදනම යාවත්කාලීන කිරීම, ආපදා තත්ත්වයකදී ජාතික එකතුව ආරක්ෂා කිරීම සඳහා ජාතික පුස්තකාල ආපදා කළමණාකරණ සැලැස්ම පිළියෙල කිරීම සඳහා කමිටු රැස්වීම් දෙකක් පැවැත්වීම, සංරක්ෂණ ගැටළු සඳහා උපදෙස් සැපයීම හා ප්‍රමිති සම්පාදනය සඳහා උපදේශක කමිටු පැවැත්වීම, ලේඛන ආරක්ෂා කර ගැනීමට පියවර ගැනීම සඳහා ලේඛන ප්‍රතිසංස්කරණය කිරීම, පුස්කොළ පොත් එකතුව වර්ධනය කරගැනීම, පුස්කොළ පොත් ආරක්ෂා කර ගැනීමට දායකවීම සඳහා දුම්මල තෙල් නිස්සාරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, ශ්‍රී ලංකාව පිළිබඳ විදේශ රටවල පලවන ප්‍රකාශන ලබාගැනීම, යන අනු ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ප්‍රගති වාර්තා මඟින් ඉදිරිපත්කර නොතිබුණි. | 2019 වසරේ දී 2018 වසර දක්වා තොරතුරු ඒකරාශි කර ඇති අතර, මෙම වසර තුළ දී පශ්චාද් උපාධි නිබන්ධන අනුක්‍රමණිකාව 2011 – 2018 හි සම්පාදන කටයුතු අවසන් කිරීමට නියමිත ය. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කර එම සැළැස්මෙහි සඳහන් කාර්යයන්හි ප්‍රගතිය ප්‍රගති වාර්තා මඟින් ඉදිරිපත් කළ යුතු බව |

**4.3** තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" පිළිබඳව ආයතනය විසින් දැනුවත් වී තිබුණ නමුත් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළගා විය යුතු සංධිස්ථානයන් ද ඉලක්ක මත ළගාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි | තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳ ව විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් අප ආයතනය වෙත යොමු කර තිබූ අංක වී.ලේ/පොදු/2018/19 හා 2018.02.18 දිනැති ලිපිය දැන ගැනීම සඳහා සහ අවශ්‍ය පියවර ගැනීම වෙනුවෙන් ආයතනයේ සියලු ම අංශ ප්‍රධානීන් වෙත යොමු කර ඇත. | ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මට තිරසර සංවර්ධන ඉලක්ක හා දර්ශක (KPI) ඇතුළත් කළ යුතුය. |